




සහන් වීරසේකර

### පැස්කුවල් දොන් ඔගස්ටින් අයිවෝ හෙවත් සුනිල් ශාන්තයන්ගේ නිල ගායන පුත්‍ර සමාගම

# අයිවෝ ඩෙනිස් නම් වන හෙළ ගී රේඛාවේ අයෝමය හඬ පෞරුෂය



90 දශකයේ එවකට සංස්කෘතික ඇමති සිටි ලොකු බණ්ඩාර උන්නැහේගේ කාමරයට ගොඩවූ බුද්දක පැටියාටත්, පාසල් මිතුරාටත් කොළ කැද කෝප්පයක් සමග හකුරු කෑල්ලක රස ප්‍රස්තාව උරගා බැලීමට අවස්ථාව ලැබීය. "ඉතින් මොකද්ද මගෙන් මේ දරුවන්ට වෙන්න ඕනි."

ඒ ගීතය ගැයුවේ සිදුවේ අයිවෝ ඩෙනිස්... යෑයි ගීතය අවසන "ආධුනික පැය" නම්වූ වැඩසටහන මෙහෙයවූ නිවේදකයා සඳහන් කළේය. චතුර නාමින් සිටි සුනිල් ශාන්තයන්ට ගුවන් විදුලියේ යන හඬක් කන වැටිණි. බම්බලපිටියේ දිය නාමින් සිටි ගුරු සුනිල් ශාන්තයන්ගේ ඇග සිතල වී ගියේ වතුර සිඟිත්තට වඩා ඒ ඇසුණු හඬ පරාසය දෙසටය. හොඳින් සවන් යොමු වූ කළ ඔහු මහත් සිත් ගත් ඒ සුනිල ආධුනික හඬට ඇලුම් කළේය. ඒ තමන්ගේ හඬක් නොවන බවට ඔහුට ප්‍රත්‍යක්ෂ විය. දින කිහිපයකට පසු තමාට පැවරූ වගකීම අකුරටම ඉටුකරමින් පැට්‍රික් දෙනිපිටිය විසින් අයිවෝ ඩෙනිස්ව සුනිල් ශාන්තයන් හමුවට කැඳවා ගෙන ආහ. මොකද එකල්හි පැට්‍රික් ගුරු සුනිල් ශාන්තයන්ගේ මරදානේ පිහිටි සංගීත ආශ්‍රමයේ සිසුවෙක් විය.

ඔව් ඉතින් අයිවෝ ඩෙනිස් මේ වැඩේ ඉන්නම ඕනි සර්. බුද්දකගේ කුඩා ඉස්මොළේ විසුවියස් කඳු පාමුල තනි විය. බොරැල්ලේ බිෂොප් වාසල හෙවත් රාජගුරු නිවහන් අඩවියේ තිබු ශබ්දාගාරය තුල අපේ උත්තම තැන නිතර ආගිය මණ්ඩියක් විය. කවුද සංගීතය සපයන්නේ. බුද්දක අන්දමන්ද විය. "සර් ගුවන් විදුලි වාදක මණ්ඩලේ"

අයිවෝ ඩෙනිස් සැම විටම ඉතාම ආදර්ශවත් හා චාම් දිවිපෙවෙතක් පවත්වාගෙන යනු ලබන අතර කතෝලික බැතිමතකු වන ඔහු දේවස්ථානය සමග ඉතා සමීපව කටයුතු කරන පුද්ගලයෙකි. එමෙන්ම ඔහු කිතුනු ගීත කලාවේද අසිරිමත් සලකුණක් තැබූ ගායකයෙකි. සුනිල් ශාන්තයන්ගේ වියෝවෙන් පසු ඔහුගේ ගීත සමුදාය මැකී යා නොදී මතු පරපුර දක්වා රැගෙන ඒමේ භාරදූර වගකීම ඉටුකරනු ලැබුවේද අයිවෝ ඩෙනිස්ය.

තොරතුරු අසා දැනගත් සුනිල් ශාන්තයෝ අයිවෝ ඩෙනිස් නම් ආධුනිකයා තරුණ ශිල්පියා තම සංගීත තක්සලාවට ඇතුළත් කර ගත්තේය. ඒ අනුව අයිවෝ සුනිල් ශාන්තයන් යටතේ සංගීතය හදාරන්නට පටන් ගත්තේය. එය තම සංගීත දිවියේ ලැබූ ස්වර්ණමය අවස්ථාවක් ලෙස අයිවෝ කවදත් සැලකූහ. 1975 දී සුනිල් ශාන්තයන්ගේ රන්වලාව සංගීත වැඩසටහනට එක්වීමට අයිවෝට අවස්ථාව උදාවිණි.

කුරුලු පරාදීසයේ * කුරුලු සිහින සාගරේ
ඔබ හා විසුමට එනු මැන* කුරුලු සුරපුරේ

තිලක සුධර්මන් ද සිල්වා ලියා ගුරු සුනිල් ශාන්තයන් සංගීතයෙන් ඔපවත් කළ ඩකුරුලු පරාදීසයේඩ ගීය ගයමින් අයිවෝ ඩෙනිස් නම්වූ හෙතෙම තම සංගීත චාරිකාවට ආරම්භය පුරනවා. නැවතත් බුද්දක ගුවන් විදුලි වාදක මණ්ඩලය ගෙන්න ගන්න විදියක් හිතන්නේ, ලපණ්ඩිත කතා කීවානම් කරගනින්ල යන සහෘද ගර්ජන මධ්‍යයේය. ලොකු බණ්ඩාර උන්නැහේගේ ලියමන ගුවන් විදුලි උත්තමයෝ අනුමත කළහ. කලක පටන් හිත තුල සැඟවී තිබු රිදී වලාවක් එලි බලමින් සිටින සංක්‍රාන්තිය උදාවිය.

වෘත්තියෙන් රජයේ ගුරුවරයකු වූ අයිවෝ රත්නපුරය, මීගමුව ආදී ප්‍රදේශවල පාසල්හි ඉගැන්වීම් කටයුතුවල ද නිරත විය. පසුව රජයේ සංගීත විද්‍යාලයේ ජන සංගීත උපදේශකවරයා මෙන්ම එකල පැවැත්වූ හෙළ මිහිර ගායන වෘන්දයේ මූලිකයා බවට ද පත් විය. ලයනල් රන්වල, වීරසේන ගුණතිලක, රෝහණ බැද්දගේ වැන්නවුන් හෙළ මිහිරේ අයිවෝගේ සමකාලීනයෝ වූහ. ඔහුගේ කටහඬ එකල සුභාවිත ගීත ක්ෂේත්‍රය දිග්විජය කළ සුනිල් ශාන්තයන්ගේ හඬට බොහෝසේ සමානකම් දැක්වීය. ඒ හේතුවෙන් සුනිල් ශාන්තයන්ගේ ගීත ගායනා කිරීමේ වැඩි අවස්ථා සංචලනය අයිවෝ සතුවිය. අයිවෝ ගායනයේදී එම ගීතවලට උපරිම සාධාරණයක් ඉටුකිරීමට සෑම විටම සමත්කම් දැක්වීය. සුනිල් ශාන්තයන්ගේ නිල ගායන පුත්‍ර සමාගම ඔහුම විය.

**වරෙන් හීන් සැරේ**
**වරෙන් හීන් සැරේ... රිදී වලාවේ...**
**අනේ හෙමින් හෙමින්**
**ඇදී යන්න වලාවේ...**

ලාංකීය සිනමා වංශයේ රේඛාව සහ සංදේශය චිත්‍රපට ද්විත්වය යනු සදා මතක සටහන් වේ. ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ රේඛාව චිත්‍රපටයට ගීතයක් ගායනා කරමින් අයිවෝ ප්‍රථම වරට සිනමා ක්ෂේත්‍රයට සේන්දු විය. පසුව සංදේශය හා හිම කතර වැනි චිත්‍රපට සඳහා ගීත ගායනයට එක්වෙමින් සිනමා ගීතයේ හඬ පරාසයන් අතික්‍රමණය කිරීමට සමත් විය. මකුලොලුව මහතා විසින් කරලියට ගෙන ආ දෙපානෝ නාට්‍යයේ ප්‍රධාන භූමිකාව රඟමින් අයිවෝ තම රංගපෑමේ හැකියාවද විදහා දැක්විය. ඔහු ගායන රංගධරයෙක් බවට පත්වීම සතිචන්ද්‍ර එදිරිසිංහගේ තහංචි ගීත නාටකයේ මනාවට ප්‍රත්‍යක්ෂ විය. ජේම්ස් පීරිස්ගේ රේඛාව චිත්‍රපටය වෙනුවෙන් සුනිල් ශාන්තයන් නියෝජනය කරමින් ඉන්දියාවට ගිය අයිවෝ ඩෙනිස් එහිදී ඕලු නෙළුම් නෙරිය රඟාලා, සුදු සඳ එළියේ, සීගිරි ළඳකගේ වැනි ගීත ගායනා ශිල්පීන්ට පුහුණු කළේය.

ශ්‍රී ලංකාව බිහිකළ විශිෂ්ට සංගීතඥයකු වූ කේමදාස මාස්ටර් මැනවින් අයිවෝ ගේ හඬ පරිශීලනය කළේය. එය හුදෙක්ම චිත්‍රපට පසුබිම් ගායනයට එහා ගිය පර්යේෂණ මට්ටමක් ගත්තේය. 1980 දී ධර්මසිරි බණ්ඩාරනායක නිර්මාණය කල හංස විලක් හි පසුබිම් ගායනය, සිය භාවපූර්ණ හඬේ අයෝමය ශක්ති ප්‍රභාවය පිළිබඳ මතක සටහනක් එක් කළේය. ඔහු 1985 වර්ෂයේ දී හිමකතර චිත්‍රපටයේ ගායනය වෙනුවෙන් ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබුවේය. ඔහු පිදීමට උතුරු කොළඹ පාසැල් පෙළ ගැසී සිටි. දිනය උදාවිය. සාහිත්‍ය දින සුනිල් ශාන්ත ගුණ සැමරුම ඇරැඹිණි.

වලාකුලින් බැස සමන් කුලත් වැද එලෝ බලා යනවා ....ඔහු හඬ අවදියෙන් මුළු පරිසරයම මොහොතකට ගල් වුනාසේ හැඟිණි. ඒ හඬ දෙවියන් දුන් මහගු තලෙන්තුවක්ම විය. යුගයෙන් යුගය සිදුවූ සමාජ විපර්යාසයන්හි හා විවිධ පරිණාමයන්හි ගොදුරක් බවට පත්වීමට ඉඩ නොදී සුභාවිත ගීයේ ආශ්වාදය සහ මිහිර යළි යළිත් මතු පරපුරට ශ්‍රවණය කිරීමට ඉඩ සැලැස්වීම වෙනුවෙන් අයිවෝ ඩෙනිස් සියලූ ශ්‍රී ලාංකිකයන්ගේ සම්භාවනාවට නිතැතින්ම පාත්‍ර විය යුතුය.

එදා උඹ මට මුසාවක් කීවේද ඔහු අසයි. මට අයිවෝ මහත්මයා අසඩක් සේ පෙනෙයි. ඔව් සර්, මඩොල් දුවේ ජින්නා සේ මම පිළිතුරු බැන්දෙමි.

**සෙනෙහස පුපුරා..පුපුරා...**
**සිහිනය මියයයි ..**
**සැබෑ උදැසන පිනිකදුලක් මත ***
**සෙනෙහස පුපුරා..පුපුරා..**
**සිහිනය මියයයි**

ඔහුගේ ළබැඳි හඬ මගේ මනස හංස විලක් කර ඇත. සමාවෙන්න සර්, බිෂොප් පැලස් එකේදී ..එහෙම කලේ ...මගේ මුව ගොළුවී කඳුළු උතුරයි.

එදා සර්ව ගෙන්න ගන්නම හිතලා නෙමේ කිවුවේ. සර් නොඑයි කියා මට පොඩි බයක් දැනුනා. ලොකු බණ්ඩාර උන්නැහේ කොක්හඬලා සිනාසෙයි. කොළ කැඳ කෝප්පය සිතල වෙලා. හකුරු දියවෙනවා.

**උදුම්බරා ඔබ හිනැහෙන තුරා බලන් ඉන්නවා**
**වරෙන් හීන් සැරේ... රිදී වලාවේ..**